ඔරලෝසුවේ කතාන්දරේ

යාකොව් ද්ලුගොලෙන්ස්කි

පරිවර්තනය

මහින්ද සෙනරත් ගමගේ

යාකොව් ද්ලුගොලෙන්ස්කි



ඔරලෝසුවෙ කතන්දරේ

පරිවර්තනය

මහින්ද සෙනරත් ගමගේ

සිතුවම්

ව්ලැඩිමීර් කුල්කෝව්

පරිගණක සැකසුම්

ගයනි නිලංකා ගලගෙදර

ඇතුළත

පළමු පරිච්ඡේදය	තේරවිලි	5
දෙවැනි පරිච්ඡේදය	වෙලාව කියන විදි දෙකක්	5
තුන්වැනි පරිච්ඡේදය	වෙලාව කියද?	7
හතරවැනි පරිච්ඡේදය	කුකුළෙක්, සමොවාරයක් සහ එලාම් ඔරලෝසුවක් ගැන	9
පස්වැනි පරිච්ඡේදය	ඔරලෝසුව ඇතුළේ තියෙන්නේ මොනවාද?	17
හයවැනි පරිච්ඡේදය	දත් ඇති පයික් මාළුවා සහ මිටිය	17
සත්වැනි පරිච්ඡේදය	යුද නැවකට වෙඩි තබන ඔරලෝසුවක්	21
අටවැනි පරිච්ඡේදය	තවත් ඔරලෝසු භාරකරුවෙක්	21
නමවැනි පරිච්ඡේදය	කාලය ගැන	23
දහවැනි පරිච්ඡේදය	පාසල් සිසු වාස්යා, මැකරෝනි සහ තත්පර ගැන	23



පළමු පරිච්ඡේදය

තේරවිලි

අපි කවුරුත් තේරවිලි වලට ආසයි. ඔබත් එහෙම නේද!
එහෙනම් අපි තේරවිලි දෙකකින් පටන් ගනිමු.
පළමුවැනි තේරවිල්ල ටිකක් පරණ එකක්. දෙවැනි එක මමම කල්පනා කළ එකක්.
ඉවරයක් නැතිව හැමදාම ගමන් කරන කෙනා කවුද?
නිශ්ශබ්ද කාමරයක මහ හඬින් 'ටික් ටොක් - ටික් ටොක්' ශබ්ද නඟන කෙනා කවුද?
ඔබට කල්පනා වුණාද?
නැත්නම් පිටුව පෙරළලා බලන්න. උත්තරය හමුවේවි! ඔව්, හරියට හරි. ඒ ඔරලෝසුව තමා.
දැන් අපි එකතු වෙලා බිත්ති ඔරලෝසුවක් හදමු. අම්මට හරි තාත්තාට හරි එහෙම නැත්නම් ආච්චිට හරි සීයට හරි කියන්න
ඔබට උදව් කරන්න කියලා.
ඉතිං දැන් ඔබ ඒක හැදුවද?
ඒක පැත්තකින් තියලා කාලය ගැන සොයා බලමු. ඒ වගේම වෙලාව කියන්නේ කොහොමද කියලා සොයා බලමු.

දෙවැනි පරිච්ඡේදය

වෙලාව කියන විදි දෙකක්

වෙලාව කියන්න හුඟක් විදි තියෙනවා. මම එයින් දෙකක් ගැන කියන්නම්.
එක ළමයෙක් හිටියා. එයාගෙන් වෙලාව කීයද කියලා ඇහුවම එයා කෙළින්ම ආත්තම්මා ගාවට දුවනවා. ගිහින් ආත්තම්මාව ඔරලෝසුව දිහාට හරවනවා. ඉතිං ආත්තම්මා ඔරලෝසුව බලලා ඒ වෙලාවේ වෙලාව කියනවා. දෙකයි, තුනයි නැතිනම් හතරයි... ඔය විදිහට.
අන්න ඒක තමා පළමුවැනි විදිහ.
ඒත් තවත් ළමයෙක් හිටියා. එයා කරන්නේ කෙළින්ම ඔරලෝසුව ළඟට යන එක. ගිහින් ටිකක් වෙලා බලා ඉඳලා තනියම වෙලාව කියනවා, පොඩ්ඩක් වත් වරදින්නේ නැතිව.
ඉතිං අපිත් උත්සාහ කරමු මේ දෙවැනි විදහ කරලා බලන්න.
කොහොම උණත්, පටන් ගන්න කලිං ඔය ගොල්ලෝ එක දෙයක් හිතේ තියා ගන්න ඕනෑ. මොකක්ද ඒ ....! කාලය කොටස් වලට බෙදලායි තියෙන්නේ කියන එක. ලොකු කොටස් වලටයි, කුඩා කොටස් වලටයි. හුඟ කාලෙකට කලිනුයි මිනිස්සු එහෙම කරන්න තීරණය කළේ.
ඒගොල්ලෝ කාලයේ කොටස් වලට නම් දුන්නා.
ලොකු කොටස් වලට කියන්නේ පැය.
කුඩා කොටස් වලට කියන්නේ මිනිත්තු නැතිනම් විනාඩි.
කුඩාම කොටස් වලට කියන්නේ තත්පර.

වෙලාව කීයද?

දැන් ඔයා හැදූ ඔරලෝසුව ගනිමු. ඒක හැබෑ ඔරලෝසුවක් වගේමයි.

ඒකට වටකුරු මුහුණක් තියෙනවා. ඒක වටේට ඉලක්කම් ඇඳලා, එකේ ඉඳලා දොළහට වෙනකම්.

කටු දෙකකුත් තියෙනවා, එකක් ලොකුයි, අනෙක කුඩායි. එකම අඩුපාඩුව තමා කටු කරකවන්න වෙන්නේ අතින් වීම.

ඒකට කමක් නෑ. අපි අතින් ඒක ක්‍රියා කරවමු.

අපි කටු දෙකම,ඒ කියන්නේ ලොකු එකයි, පොඩි එකයි දොළහ කෙළින් තියමු. ඔබ දන්නවද ඒකේ තේරුම? ඒකෙන් කියන්නේ වෙලාව දොළහයි කියන එක.

දැන් අපි ලොකු කටුව එහෙමම තියමු. පොඩි කටුව එක ළඟට කරකවමු. ඔබ දන්නවද ඒකේ තේරුම? ඒකෙන් කියන්නේ වෙලාව හරියටම එකයි කියන එක.

පොඩි කටුව දෙක ළඟට ගෙනාවොත් මොකද වෙන්නේ? එතකොට ඔරලෝසුව පෙන්නාවි වෙලාව දෙකයි කියලා.

තුන ළඟට පොඩි කටුව ගෙනා විට වෙලාව තුනයි.

හතර ළඟට පොඩි කටුව ගෙනා විට වෙලාව හතරයි.

ඒ විදිහටම එකොළහ ළඟට පොඩි කටුව ගෙනා විට වෙලාව එකොළහයි.

පොඩි කටුවේ තියුණු තුඩ එක, දෙක, තුන, පහ, හත නැතිනම් එකොළහ කෙළින් තියෙන වෙලාවක ලොකු කටුව දොළහ ළඟම තියෙනවා නම් දැන් ඔබ හරියටම වෙලාව දන්නවා. අම්මා, වෙලාව කීයද ඇහුවොත් ඔබට උත්තරේ කියන්න පුළුවන්.

අපි ඒ ගැන පරීක්ෂා කරලා බලමු. පුංචි කටුව පහ කෙළින් තියෙනවා. ලොකු කටුව දොළහ කෙළින් තියෙනවා. වෙලාව කීයද? උත්තරය පහයි.

දැන් අපි ලොකු කටුව හය ළඟට කරකවමු. ඒක එතනම තියෙන්න හරිමු. දැන් ආයෙත් කුඩා කටුව කරකවමු.

කුඩා කටුව 12ත් 1ත් මැද නතර කරමු. දැන් වෙලාව කීයද? දොළහ හමාරයි. (හමාරයි කියන්නේ බාගයක් කියන එකයි. ඔය ගොල්ලො පාන් ගෙඩි 1කුත් බාගයක් ගේන විට කියන්නේ පාන් එක හමාරයි කියලානේ)

දැන් කුඩා කටුව 1ත් 2ත් මැද නතර කරමු.වෙලාව එක හමාරයි.

කුඩා කටුව 2ත් 3ත් මැදට ගෙනාවොත් වෙලාව දෙක හමාරයි.

කුඩා කටුව 3ත් 4ත් මැදට ගෙනාවොත් වෙලාව තුන හමාරයි.

එතකොට 4ත් 5ත් මැදට ඒක ගෙනාවොත්? වෙලාව හතර හමාරයි.



මතක තබා ගන්න. ලොකු කටුව 6 ඉලක්කම උඩ තිබෙන විට සහ කුඩා කටුව ඉලක්කම් දෙකක් අතර තියෙන විට වෙලාව වන්නේ දොළහ හමාර, එක හමාර, දෙක හමාර, පහ හමාර, එකොළහ හමාර විදිහටයි. කුඩා ඉලක්කම මීට ටික වෙලාවකට කලින් පහු කළ ඉලක්කම අනුව තමයි ඒක තීරණය කරන්නේ. ඒ කියන්නේ කුඩා කටුව පහු කළේ එක නම් දැන් තියෙන්නේ එක දෙක මැද නම් වෙලාව එක හමාරයි....

අපි පරීක්ෂා කරලාම බලමු. ලොකු කටුව හයේම තියෙනවා. කුඩා කටුව එකොළහ සහ දොළහ මැද තියෙනවා. වෙලාව කීයද?

උත්තරය: වෙලාව එකොළහ හමාරයි.

ඔබ හරි උත්තරේ දුන්නද? ඔව් එහෙම තමා නේද! දැන් ඔබ වෙලාව කියන හැටි ගැන හුඟක් දේ දන්නවා.

දැන් මේ පිටුව ආපස්සට පෙරළා බලන්න.

හතරවැනි පරිච්ඡේදය

කුකුළෙක්, සමොවාරයක් සහ එලාම් ඔරලෝසුවක් ගැන

ඔබට පෙනෙනවා ඇති චිත්‍රයේ ඔරලෝසු හමුදාවක්ම ඉන්නවා. ඒවා අපිට වෙලාව බලාගන්න උදව් වෙනවා.

ලෝකයේ තියෙන හැම වර්ගයකම ඔරලෝසු චිත්‍ර ශිල්පී මාමා මෙතන ඇඳලා නෑ. මොකද ඇඳලා ඉවර කරන්න අමාරු තරමට ඔරලෝසු වර්ග හදලා තියෙන නිසා.

මේ ඔරලෝසු ගැන මම ටිකක් ඔබට කියා දෙන්නම්. ඒත් මම දන්නවා ඔබ තරමක් පුදුමයෙන් එක දෙයක් ගැන කල්පනා කරනවා කියලා. චිත්‍ර ශිල්පී මාමා මොකද කුකුළෙකුයි, සමොවාරයකුයි ඇන්දේ. (සමොවාරය කියන්නේ රුසියාවේ තේ උණු කරන්න ඉස්සර කාලේ ප්‍රයෝජනයට ගත් ලොකු කේතලයක් වැනි උපකරණයකට)

එයා කුකුළෙක් ඇන්දේ මොකද? කුකුළාත් එක විදිහක ඔරලෝසුවක් නිසයි. ජීවමාන ඔරලෝසුවක්. සැකක් නැතිවම කියන්න පුළුවන් කුකුළා යාන්ත්‍රික නොවන බව. ඉස්සරම කාලේ, ඒ කියන්නේ මිනිස්සුන්ට ඔරලෝසු නොතිබුණු කාලේ වෙලාව දැන ගන්න උදව් කළේ කුකුළායි.

උදේ පාන්දර කුකුළා අඬලනවා. ඒකේ තේරුම දවස පටන් ගන්නවා කියන එකයි. හැන්දෑවේ කුකුල්ලු ලගින්න ගස් උඩට ඉගිල්ලෙනවා. (කුකුල්ලුත්, කිකිළියෝත් නිදා ගන්නේ ගස් උඩ ලැගලා බව ඔබ දන්නවා) ඒකේ තේරුම නින්දට යන්න වෙලාව කියන එකයි.



ඒත් කුකුළා ගැන හැම වෙලේම විශ්වාස තියා ගන්න පුළුවන් වුණේ නෑ. සමහර වෙලාවට ඌ ලැගපු තැනින් ඇදගෙන වැටිලා වෙලාවට කලින් 'කුක් කු කුක් කු.....' කියලා කියනවා. තවත් සමහර වෙලාවට නරියෙක් කුකුළාව ඩැහැගෙන දුවනවා. එහෙම වුණාම මිනිස්සුන්ව අවදි කරන්න කවුරුවත් නැති වුණා.

ඉතිං වැඩියෙන් විශ්වාසවන්ත ඔරලෝසුවක් සොයා ගත්තා. ඒක තියපු තැනින් ඇදගෙන වැටුණේ නැතුවා වගේම නරියාට කෑමට ඩැහැගෙන යන්නත් පුළුවන් වුණේ නෑ.

ඒකයි සමොවාරයකුත් ඒ පිටුවේ ඇඳලා තියෙන්නේ. සමොවාරයත් ඔරලෝසුවක්. වතුර ඔරලෝසුවක්. බාල්දියකින් එකක් වතුර මේ සමොවාරයට දානවා. ඊට පස්සේ සමොවාරයේ කරාමය යාන්තමට අරිනවා. සමොවාරයේ වතුර ඉවර වෙන්න පැයක් යනවා. වතුර ඉවර වුණු ගමන් දැන ගන්න පුළුවන් පැයක් ගත වුණා කියලා. එතකොට තවත් වතුර බාල්දියක් පුරවනවා. ඉතිං වෙලාව බලා ගන්න නම් දවස තිස්සේම ඔය විදිහට වතුර පුරවන්න සිද්ධ වුණා.

ඒක හුඟාක් පරණ ඔරලෝසුවක්. තනියෙන් වැඩ කරන, කටු තියෙන හැබෑ ඔරලෝසුවක් නිපදවා ගන්න බැරි වුණා නං සමොවාරයේ ඔරලෝසුව තාම වැඩ කරන්න ඉඩ තිබුණා. ඉතිං අලුත් ඔරලෝසුව නිපදෙව්වේ අවුරුදු අට සීයකට කලිං.

ඒක නගරය මැද්දේ උස කණුවකයි සවි කළේ. ඒකට කිව්වේ ඔරලෝසු කණුව කියලායි. නගරයේ තිබුණු ප්‍රධාන ඔරලෝසුව ඒකයි.

ඒ ජාතියේ ඔරලෝසුවක් කිසි කෙනෙකුට ගෙදරකට නං ගෙනියන්න බෑ. ඒක ඒ තරම් විශාලයි. ඉතිං මිනිස්සුන්ට සිද්ධ වුණා කුඩා ප්‍රමාණයේ ඔරලෝසුවක් සැලසුම් කරන්න. මිනිස්සු හරිම වාසනාවන්තයි. ගණන් කරන්න අමාරු තරමට ඔරලෝසු වර්ග නිෂ්පාදනය වුණා.

ඒවායින් ටිකක් මෙහෙමයි.

උදුන උඩින් තබන ඔරලෝසු (යුරෝපයේ සීතල නිසා ගේ උණුසුම් කිරීමට ඇති උදුන ගෙයි ප්‍රධාන තැනක් ගන්නවා).

බිත්තියේ එල්ලන බිත්ති ඔරලෝසු.

පොළොවේ සිටුවා තබන ග්‍රෑන්ඩ් ෆාදර් ඔරලෝසු.



අන්තිමේ මේසය උඩ තියන මේස ඔරලෝසු.

නිතර ගෙදර ඉන්නේ නැති අය වෙනුවෙන් (ඒ කියන්නේ සෙබළු, එහේ මෙහේ ඇවිදින්න යන අය වගේ අය) වඩාත් පුංචි ඔරලෝසු නිපදවුවා. මෙන්න මේ වගේ: සාක්කුවේ දාගෙන යන සාක්කු ඔරලෝසු, අතේ බඳින අත් ඔරලෝසු....

පරක්කු වෙලා ඇහැරෙන අය ගැනත් ඔරලෝසු නිෂ්පාදකයින්ට කොහොමටවත් අමතක වුණේ නෑ.

එලාම් ඔරලෝසුව අති විශිෂ්ඨ දෙයක්. එය වයින් කරලා නැගිටින්න ඕනෑ වෙලාව සකස් කරලා තිබ්බම හිතේ කරදරයක් නැතිව නිදාගන්න යන්න පුළුවන්. හරියටම පැයට, විනාඩියට, තත්පරයට එලාම් ඔරලෝසුව හඬින් සද්ද කරාවි. ට්‍රිං.....(නවීන ඔරලෝසු වයින් කරන්න ඕනෑ නෑ වගේම විවිධ සංගීත ශබ්ද ඇති කරනවා) එවිට ඔබට අවදිවෙලා ඇඳෙන් නැගිටින්න පුළුවන්.

පේන විදිහට ඉස්සර කාලේ අය හුඟාක් සනීපයට නිදාගෙන තියෙනවා. පුංචි සීනු නාදෙකින් ඒ අයව එක වරම අවදි කරවන්න අමාරු වුණා. ඒ වගේ තදට නිදා ගන්න අය වෙනුවෙන් විශේෂ ඔරලෝසුවක් නිපදෙව්වා.

ඒකට කියන්නේ කාලතුවක්කු ඔරලෝසුව. හරියටම නියමිත වෙලාවට ඒකෙන් වෙඩිල්ලක් පත්තු වෙනවා. ඒකට වෙඩි බෙහෙත් කවලා නියමිත වෙලාවට ගිනි ගන්න සකසාලයි තිබුණේ.

පැද්දෙන එලාම් ඔරලෝසුව: මේ ඔරලෝසුව සංකීර්ණ යාන්ත්‍රණයකට සම්බන්ධ කරලා තිබුණා. මේක නියමිත වෙලාවට හෙළවෙන්න පටන් අරන් පැද්දිලා ඇවිත් ඇඳේ වදිනවා. නිදා ඉන්න කෙනා කැමති වුණත් නැතත් ඉතිං නැගිටින්න සිද්ධ වුණා.

මේ ජාතියේ ඔරලෝසු නිපදවුණේ පිරිමි අය වෙනුවෙනුයි.

ගැහැනු අයටයි ඒ තරම් සවි බල නැති අයටයි සුවපහසු ඔරලෝසු ඒවා ඕනෑ වුණා.

උදාහරණයක් වශයෙන් සමහර එලාම් ඔරලෝසු නියමිත වෙලාවට සුවඳ විලවුන් විදින්න පටන් ගත්තා. තවත් සමහර ඔරලෝසු විද්දේ ලෙමනේඩ්.

සමහර කාන්තාවන් සුවඳ විලවුන් වලින් අවදි වෙන්න කැමති වුණා. අනිත් අය ලෙමනේඩ් වලින් අවදි වෙන්න කැමති වුණා.

නැව් වලට විශේෂ ඔරලෝසුවක් නිපදවා තිබුණා. ඒකට කීවේ නාවික ඔරලෝසුව කියලා. නාවුක ඔරලෝසුවක් නැතිව දැන් නම් එකම නැවක් චත් මුහුදු ගමන්වල යොදවන්නේ නෑ. සාමාන්‍ය ඔරලෝසු මුහුදු ගමන් වලට සුදුසු නෑ. නැව හැම වෙලාවෙම එහාට මෙහාට පැද්දෙනවා. ඒ කාලේ හැදුව ඔරලෝසු මේකට ඔරොත්තු දුන්නේ නෑ. ඒවා ඉක්මණින්ම වැරදි වෙලාවන් දක්වන්න වුණා.

නාවුක ඔරලෝසුව හදාගන්න කලිං, ඉස්සර නාවික කපිතාන් වරුන්ට නිතරම පාර වැරදිලා හතර අතේ ගමන් ගත්තා. එහෙම නැත්නම් ගමනාන්තයට එනකොට හොඳටම ප්‍රමාද වුණා.

ඉතිං, ඇත්තටම මේ අය විශ්වාසය තැබිය හැකි ඔරලෝසුවක් ගැන සිහින මැව්වා.

නාවිකයන්ගේ අනුග්‍රාහකයා හැටියට තමන්ම සලකාගත් ස්පාඤ්ඤයේ රජු ප්‍රකාශ කළා, ලොකු තෑග්ගක් දෙන බවට. ඒ නාවිකයින් සඳහා නිවැරදි ඔරලෝසුවක් නිපදවන කෙනාට. ඉංග්‍රීසි පාර්ලිමේන්තුවත් ඒකම ප්‍රකාශ කළා.

අන්තිමේදී ජෝන් හැරිසන් කියලා නමක් තියෙන කෙනෙක් මේ ඔරලෝසුව හැදුවා.

එයා බ්‍රිතාන්‍යයේ නාවික සේනාංක පරිපාලන මූලස්ථානෙට ආවා. ඇවිත් ඔරලෝසුව මේසය උඩින් තිබ්බා.

"මේ මොකක්ද?" ඉංග්‍රීසි නාවික ප්‍රධානියෝ ඇසුවා.

"නාවික ඔරලෝසුවක්. හැම නැව් කපිතාන් කෙනෙක්ම හීන දක්ක ඔරලෝසුව."

එය එක්වරම පරීක්ෂණයට බඳුන් කළා. එම ඔරලෝසුව සම්බන්ධ කළ නැවක් ගමන් ආරම්භ කළා. එය මඟ නොවැරදී හරියටම වෙලාවට ගමනාන්තයට ළඟා වුණා.

ඒ වගේම 'වෙස් ඔරලෝසුවකුත්' නිපදවුණා. ඒකට දැන් අවුරුදු සියයකට වැඩියි.

මේක හදන්න කලිං එක වෙස් ක්‍රීඩකයෙක් ඉත්තෙක් අදින්න සමහරවිට විනාඩි දහයක් විතර කල්පනා කළා. අනිත් කෙනා ඊළඟ ඉත්තා අදින්න දවසක් කල්පනා කළා. මේක පිස්සු හැදෙන තරං වැඩක් වුණා. එවිට මෙහෙම කියන්න වෙනවා.

"දක්ෂ මහත්තයා, කාලය අදින්න එපා!"

එවිට ඔහු පිළිතුරු දෙනවා ඇති.

"මං මේ කාලය අදිනවා නෙවෙයි. මගේ කොයි ඉත්තා කොතනට අදිනවාද කියල හිතනවා විතරයි."

දැන් නම් හැම ක්‍රීඩකයාටම නිශ්චිත කාලයක් වෙන් කර දෙනවා. ඒ කාලය තුළ එයාගේ ඉත්තො නියමිත ගාණක් නොඇද්දොත් ඔරලෝසුව මත රතු කොඩියක් වැටෙනවා. ඒකෙ තේරුම "ඔබේ කාලය අවසානයි. ඔබ තරගයෙන් පරාදයි, දක්ෂ මහත්මයා!" යන්නයි.

මෙතෙක් ඔබට කියාදුන් හැම ඔරලෝසු වර්ගයක්ම තවම මිනිසාට සේවය කරමින් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒවා කාලයෙන් කාලයට අලුත් වැඩියා කරනවා. ගෙවුණු කොටස් වෙනුවට අලුත් කොටස් එකතු කරනවා. දැනට භාවිත නොවන්නේ 'කාලතුවක්කු ඔරලෝසු', 'සමොවාරයේ ඔරලෝසු', 'සුවඳ විලවුන් ඔරලෝසු' සහ 'ලෙමනේඩ් ඔරලෝසු' විතරයි.

ඉතිං දැන් ඔබ ඔරලෝසු ගැන වගේම වෙලාව කියන හැටි ගැන ඉගෙන ගත්තා. ඔබෙන් දැන් දෙයක් අහන්න ඕනෑ.....



ඔරලෝසුව ඇතුළේ තියෙන්නේ මොනවාද?

මං හිතනවා ඔබත් ඔබගෙන්ම මේ ප්‍රශ්නය බොහෝ වතාවක් අහලා ඇති කියලා.

හැම ජාතියේම ඉන්න හැම ළමයෙක්ම ඒ ප්‍රශ්නය අහනවා. මමත් පුංචි කාලේ එහෙම ඇහුවා.

ඇත්තෙන්ම ඔරලෝසුව ඇතුළේ තියෙන්නේ මොනවාද? කවුද ඒක ඇතුළේ වාඩි වෙලා 'ටික් ටොක් - ටික් ටොක්' කියන්නේ.

මං පුංචි ළමයෙක් කාලේ හැමෝම වෙනුවෙන් මේ ප්‍රශ්නය විසඳන්න මං කල්පනා කළා. මගේ සීයාට තිබුණා ලොකු සාක්කු ඔරලෝසුවක්. ඒක හැඩයෙන් එෑණු ගෙඩියක් වගේ. සීයා සමහර වෙලාවට ඒක මගේ අතට දෙනවා. ඒ ජාතියේ කිසිම ඔරලෝසුවක් අපේ ගෙදර තිබුණේ නෑ.

ඉතිං දවසක් සීයා මාව තනියම කාමරේ තියලා ගිය වෙලාවක මම ඔරලෝසුව ගලවන්න පටන් ගත්තා.

මුලින්ම මම කළේ ඔරලෝසු මූණත ඉදිරියේ තියන වීදුරුව ගැලවීමයි. මගේ පුදුමයට ඔරලෝසුව තාමත් ටික් ටොක් -ටික් ටොක් කියනවා.

මූණතේ බලන්න දෙයක් නැති නිසා මම ඔරලෝසුව අනිත් පැත්ත හැරෙව්වා. ඊට පස්සේ පිටිපස්සේ පියන ගැලෙව්වා. එතකොට මම දැක්කා ටික්-ටොක් හඬ නඟන්නේ මොකක්ද කියලා. එකට එක්කාසු කරපු ලස්සන ඔරලෝසු කාර්මික වැඩක්. ගණන් කරන්න බැරි තරම් ඇණ, මුරිච්චි, කැරකෙන දැති රෝද, හීන් දඟරයකට එතුණු තදවුණු කම්බියක්.... මුළු යන්ත්‍රයම සෙලවෙමින්, කැරකෙමින් ටික්-ටොක් හඬ නඟමින් තිබුණා. මුලින්ම මගේ කුතුහලයට අහුවුණේ බොහෝම සියුම් දඟරයයි. ඊට පස්සේ මං පුංචි දැති රෝදයක් ගලවලා බැලුවා. ඊට පස්සේ සිදු වුණු දේ ගැන විස්තර ඇතිව කියන්න ඕන නැහැනේ. මගේ සීයා මේ සිද්ධියෙන් පස්සේ හුඟ කාලයක් යන තුරාම මාත් එක්ක කතා කළේ නෑ. ඒ ඔරලෝසුව මගේ සීයා තරුණ කාලේ තෑග්ගක් හැටියට ලැබුණු එකක්. ඒක එයාට හුඟාක් වටින එකක්.

අද කාලේ වෙනස්. ඇතුළේ තියෙන්නෙ මොනවද බලන්න අද ළමයෙකුට සීයගේ ඔරලෝසුව ගලවලා බලන්න ඕන වෙන්නේ නෑ. හුඟක් සෙල්ලම් බඩු කඩවල තියෙනවා 'තරුණ ඔරලෝසු කාර්මිකයා' කියලා සෙල්ලම් බඩු පෙට්ටියක් විකුණන්න. හැබෑ ඔරලෝසුවක් හදාගන්න ඕනෑ කරන හැම දේම ඒකෙ තියනවා. ඒක ළමයෙකුටම හදා ගත හැකියි. ඒක 'ටික් ටොක්' කියනවා විතරක් නෙවෙයි, හැබෑම වෙලාවත් පෙන්නනවා.

දත් ඇති පයික් මාළුවා සහ මිටිය

පෙට්ටියේ තියෙන උපකරණ වලින් ඔබටත් හැබෑ ඔරලෝසුවක් හදා ගත හැකියි කියලා මම හිතනවා. හැබැයි මතක තියා ගන්න ඕනෑ, මෙන්න මේවා. ඒක හොළවන්න හොඳ නෑ, ඒකට දූවිලි යන්න දෙන්න හොඳ නෑ වගේම වතුර වැක්කෙරෙන්න දෙන්න හොඳ නෑ. එහෙම දේවලට ඔරොත්තු දෙන්න පුළුවන් විශේෂයෙන්ම ඒ විදිහට හැදූ ඔරලෝසු වලට පමණයි. ඒ කියන්නේ, ජලයට ඔරොත්තු දෙන, දූවිල්ලට ඔරොත්තු දෙන, ගැස්සිල්ලට ඔරොත්තු දෙන ඔරලෝසු වලට විතරයි.

තවත් විදිහකින් කියනවා නම් ඒ විදිහට හැදූ ඔරලෝසුවක් අතේ බැඳගෙන ඔබට නාන්න පුළුවනි. ඒ වගේම ඒ අතින්ම මිටියකින් යමක් තලන්න පුළුවනි. ඇයි ඒක බැඳගෙනම දූවිල්ල තියෙන පාරක බයිසිකලයක් පැදගෙන යන්නත් පුළුවනි.

ඒක ඔප්පු කරන්න කුතුහලය ඇති කරවන උදාහරණ ටිකක් මෙන්න.

ලෙනින්ග්‍රාඩයේ පුවත් පතක මෙහෙම පළවුණා

රාජ්‍ය ගොවිපොළක වැද්දුම් කරුවෙකු වූ ඉවාන් කොනොනෙන්කෝ පයික් මාළුවෙකු ඇල්ලීය. මාළුවා ශුද්ධ කරද්දී බඩ ඇතුළේ තිබී ඔරලෝසුවක් හමු වුණු විට ඔහු කොතෙක් පුදුමයට පත් වෙන්නට ඇත්දැයි සිතා බලන්න! ඔහු වයින් කොට බලද්දී සළුය වැඩ කරන්නට විය. දැන් එය අවුරුදු තුනක් තිස්සේ වැඩ කරමින් තිබේ.

පයික් මාළුවා ජීවත් වන්නේ ජලයෙහිය. එහෙයින් ඔරලෝසුව නිසැකවම මෙම ඔරලෝසුව වතුරට ඔරොත්තු දීමේ පරීක්ෂණයට බඳුන් වී තිබේ.

තවත් පුවත් පතක් පහත වාර්තාව ගෙන ආවේය.

'මම වෘත්තියෙන් සපත්තු මහන්නෙක්. මම වැඩ කරන කොට නිතරම ඇණ වලට මිටියෙන් තලනවා. මම කිසිදාක වැඩ කරද්දී ඔරලෝසුව අතින් ගලවන්නේ නෑ. මුලදී නං මම බය වුණා, ඒක වැඩ නොකරයි කියලා. මම දැන් දන්නවා මේ ඔරලෝසුව ගැස්සීම් වලට ඔරොත්තු දෙනවා කියලා. මම මේ ඔරලෝසුව බැඳගෙන අවුරුදු දහයක් තිස්සේ මිටියෙන් වැඩ කරනවාඳ ඒත් ඔරලෝසුව තාම හරියටම වෙලාව පෙන්නනවා.'

තවත් එකම එක පුවත්පත් වාර්තාවක් බලමු.

'මෙම ලිපිය ලියන්නේ උයන් පල්ලකු විසිනි. නමින් සිදොරොව්ය. අවුරුදු දෙකකට පෙර මගේ ඔරලෝසුව නැති විය. මේ සරත් සමයේ මට එය ඇපල් ගසක් යට තිබී හමුවිය. එය අවුරුදු දෙකක් තිස්සේ දූවිල්ලට, වැස්සට හා හිමට අසුවෙමින් තිබිණි. මම එය වයින් කොට බැලූ විට හොඳින් වැඩ කරන්නට විය. එය ඉතා අනර්ඝ නිපැයුමක් හෙයින් අපේ ඔරලෝසු කර්මාන්ත ශාලාවට ස්තුති කිරීමට මට උවමනාය.

අද නිපදවන ඔරලෝසු මෙවන් වර්ගයේ ඒවා. නිසැකවම ආදී කාලයේ ඔරලෝසු එවන් පරීක්ෂණ වලට ඔරොත්තු නොදෙනවා ඇත!

යුද නැවකට වෙඩි තබන ඔරලෝසුවක්

මේ පරිච්ඡේදය ඔරලෝසුවක් හා බැඳුණු ජීවිතයක් ඇති මිනිසෙකු ගැනයි.

විවිධ රටවල විවිධ නගරවල ඔරලෝසු කණු තිබෙනවා. එවන් එක් ඔරලෝසු කණුවක් නෝර්වේ රටේ එක් කුඩා නගරයකද තිබුණා. මේ ඔරලෝසු කණුව ගැන පුදුම සහගත කතාවක් කියැවෙනවා.

දිනපතාම මහලු ඔරලෝසු භාරකරුවා මේ කණුවේ පඩි පෙළ දිගේ නැංගා. නැඟලා ඔරලෝසුව පසෙකින් තිබුණු කාලතුවක්කුවෙන් වෙඩිල්ලක් තියනවා. එතකොට නගර වැසියෝ දන්නවා වෙලාව දවල් දොළහයි කියලා.

ඉන්පස්සේ දෙවැනි ලෝක යුද්ධය ඇරඹුනා. ඔරලෝසු කණුව ඇති නගරයත්, ඇත්ත වශයෙන්ම මුළු නෝර්වේ රටත් නාසි හමුදා අල්ලා ගන්නා දවස එළැඹුණා. ජර්මානු යුද නැවක් නගරයේ තිබුණු වරායෙහි නැංගුරම් දැම්මා.

එදාත් වෙනදා වගේම මේ ඔරලෝසු භාර කරුවා පඩි පෙළ නැංගා. හැබැයි එදා එයා කලාතුවක්කුවට දැම්මේ පරණ විශාල උණ්ඩයක්. එයා ඒක නාසි නැවට ඉලක්ක කළා. හරියටම දවල් දොළහට වෙඩිල්ල පත්තු කළා.

උණ්ඩය වැදුනේ නැවේ වෙඩි බෙහෙත් ගබඩාවට. නැව පුපුරලා ගියා.

නාසීන්ට කොහොමටවත් ඔරලෝසු බාරකරුවාව හොයා ගන්න බැරි වුණා. නගර වැසියෝ එයාව හැංගුවා. නෝර්වේ රට ආපසු නිදහස ලබා ගත්තාට පසු මේ මහලු මිනිසාට ඉහළම හමුදා පදක්කම පිරිනැමුවා.

පුංචි පුදුමයක්! පරණ කාල තුවක්කු උණ්ඩයකින් මහලු මනුස්සයෙක් සතුරු නැවකට වෙඩි තියන එක හැමදාම වෙන වැඩක් නෙවෙයි.

තවත් ඔරලෝසු භාරකරුවෙක්

ඉවාන් ෆෙදොතොවිච් ෆෙදෝතොව් කිසිදාක කාලතුවක්කු උණ්ඩයකින් වෙඩි තැබුවේ නෑ. ඒත් එයාත් අර විදිහටම 'ලෙනින්ග්‍රාදය රැක ගැනීම' වෙනුවෙන් පදක්කමක් ලැබුවා. මොකද එයාත් යුදමය වික්‍රමයක් සිදු කොට තිබුණු නිසා.

යුද්ධය ඇරඹෙන කොටත් (මේ කියන්නේ නාසි ආක්‍රමණිකයින්ට විරුද්ධව සෝවියට් දේශයේ ජනතාව කළ ශ්‍රේෂ්ඨ දේශප්‍රේමී යුද්ධය ගැනයි) ඉවාන් ෆෙදොතොවිච් මහලු මනුස්සයෙක්. අවුරුදු හතලිහක් තිස්සේම එයා ලෙනින්ග්‍රාදයේ ඔරලෝසු කණුවක භාරකරු විදිහට වැඩ කළා. එයා දවස ගානේම ඔරලෝසු කණුවට නැඟලා ඔරලෝසුව වයින් කළා. කිලෝග්‍රෑම් පණහක් බර ඊයම් ගුලියක් ඉහළට ඇදීමෙනුයි ඒ ඔරලෝසුව වයින් කරන්න තිබුණේ.

මහලු ඔරලෝසු කාර්මිකයාට ඉඩ තිබුණා නාසි බෝම්බ වලින්, ෂෙල් වෙඩි වලින්, බඩගින්නෙන් බේරිලා පැත්තකට වෙලා ඉන්න. ඒත් එයා එහෙම කරන එක ප්‍රතික්ෂේප කළා.

"මං එහෙම ගියොත් කවුද ඔරලෝසුව බලා කියා ගන්නේ? හිතමුකෝ අහළක බෝම්බයක් වැටිලා කෑලි වැදිලා ඔරලෝසුව කැඩුණා කියලා. කවුද එතකොට ඒක අළුත්වැඩියා කරන්නේ? බඩගින්න ගැන බැළුවොත්..... මුළු ලෙනින්ග්‍රාද් නගරෙම ඇයෝ බඩගින්නේ.....මං විතරක් පැනලා යන්නේ ඇයි?"

ඉතිං එයා නගරෙම රැඳී හිටියා.

60
5
10
15
20
25
30
35
40
45
50
55

ෙදොතොව්ගේ ඔරලෝසුව නගරය වටලනු ලැබ තිබුණු දින නමයසියය පුරාම එක තත්පරයක් නෑර හරියට ම වැඩ කළා. ලෙනින්ග්‍රාද් වැසියෝ තමන්ගේ අත් ඔරලෝසුවල වෙලාව තියා ගත්තේ ඒක බලලායි. ලෙනින්ග්‍රාදය අවට යුද අගල් වලට යන සෙබළු වෙලාව බැලුවෙත් ඒකෙන්.

හිතලා බලන්න ඒ වගේ වයසක කෙනෙක් එච්චර උස පඩි පෙළක් දවස ගානේ නඟින එක ගැන, බඩගින්නේ ඉඳගෙන, දුර්වල අත් වලින් ඒ වගේ බරක් උස්සමින් ඔරලෝසුව වයින් කරන එක ගැන.

ලෙනින්ග්‍රාද් වැසියෝ කොහෙත්ම යටත් වුණේ නම් නෑ. ජයග්‍රාහී දිනය දකින්නට මහලු ඔරලෝසු භාරකරුවාත් ජීවත් වුණා.

1945 මැයි 09 වැනිදා සෝවියට් ජනතාව නාසීන්ට විරුද්ධව ජයග්‍රහණය ලැබුවා. එදාත් වෙනදා වගේම ඉවාන් ෙදොතොව්ච් තමන්ගේ ඔරලෝසු කණුවට නැඟලා ඔරලෝසුව වයින් කළා.

නමවැනි පරිච්ඡේදය

කාලය ගැන

ඔබ දැන් මුළු පොතම වගේ කියවලා තියෙන නිසා මම ඔබෙන් ප්‍රශ්නයක් අහන්න ඕනෑ.

වෙලාව කියන්නේ මොකක්ද? අපි මේ මුළු පොත පුරාම මේ වචනය ගැන කථා කළා.

ඔබ පුදුමයෙන් පිළිතුරු දෙනු ඇති.

"ඒ මොකෝ එහෙම අහන්නේ? වෙලාව කියන්නේ ඔරලෝසු. උදාහරණයක් හැටියට ඵලාම් ඔරලෝසු. ඒක කාටත් පැහැදිළියිනේ."

පේන විදිහට පැහැදිළි තමා. ඒත් හරියටම හරි නැහැ.

මොකද කියනවා නම් ඔරලෝසුව කියන්නේ වෙලාව නොවන නිසා. ඒක වෙලාව නැතිනම් කාලය මනින යන්ත්‍රයක්. කාලය පේන්නේ නෑ. ඒකට පාටක් නෑ. ඒක අතින් අල්ලන්න බෑ.

හිතලා බලන්න.... අපි කථා බහේදී බොහෝ ගණනක් දේවල් සඳහන් කරනවා. ඒත් ඒ දේවල් වලින් සමහර දේ අතින් අල්ලලා බලන්න බැරි දේවල්. හුළඟත් එහෙම දෙයක් නේද?

ඒත් මිනිස්සු ඉගෙන ගෙන තියෙනවා නොපෙනෙන හුළඟේ බර මනින්න. ඉතිං ඒ වගේ ඒ අය ඉතාම නිවැරදිව පෙනෙන සහ අතට දැනෙන ඔරලෝසු නිපදවලා තියෙනවා, නොපෙනෙන කාලය ගණින්න.

දහවැනි පරිච්ඡේදය

පාසල් සිසු වාස්යා, මැකරෝනි සහ තත්පර ගැන

අප වෙනුවෙන් කාලය තබා ගන්නේ ඔරලෝසු පමණක් නොවන බවත් ඊට ඔරලෝසු කාර්මිකයන් සහ ඔරලෝසු භාරකරුවනුත් සහභාගි වෙන බව දැන ගන්න අපට අවස්ථාව ලැබුණා.

ඒත් අපි අතරේ ඉන්න හැම දෙනාම කාලය පිළිබඳව හරියට විමසිලිමත් වීමක් නැහැ. එයට ඔරලෝසුවලටවත්, අඩු ගණනේ ඔරලෝසු භාරකරුවන්ටවත් කරන්න දෙයක් නෑ.

අපි උදාහරණයක් බලමු.

මිනිත්තුවක්- ඒක හුඟක්ද, ටිකක්ද?

සමහරුන්ට නම් ඒක හුඟාක්. තවත් අයට ඉතාම ටිකක්. කෙනෙක් මිනිත්තුවකදී හුඟාක් දේ කරාවි. තව කෙනෙක් පැයකටවත් කරල ඉවර කරන දෙයක් නැති වේවි.

පුංචි ළමයෙක් අම්මට මෙහෙම කියනවා වෙන්න පුළුවන්.

"මට අයිස් ක්‍රීම් එකක් ඕනි."

ඒක කෙළින්ම ඉල්ලීමක්. ඒක කියද්දි යන්නේ එක ම තත්පරයයි. ඕනවට වඩා වැඩියෙන් නැතිනම් අඩුවෙන් කාලය ගෙවෙන්නේ නෑ.

ඒ පිරිමි ළමයම සමහරවිට තත්පර දහයක් කෙඳිරි ගගා ලත වෙනවා වෙන්නත් පුළුවනි.

"අනේ අම්මේ, මට අයිස් ක්‍රීම් එකක් ඕනේ. අනේ මට එකක් අරන් දෙනවද?" ඒ විදිහට.

ජනප්‍රිය කෙටි දුර ශූර වලෙරි බොර්සෝව් තත්පර දහයකදී මීටර් සියයක් දුවලා ඔලිම්පික් රන් පදක්කමක් දිනා ගත්තා.

එක මිනිත්තුවකදී රස කැවිලි සාදන යන්ත්‍රයකින් රස කැවිලි පණහක් සාදනවා.

එක මිනිත්තුවකදී මැකරෝනි සාදන යන්ත්‍රයකින් කිලෝ ග්‍රෑම් පහක මැකරෝනි සාදනවා.

එතකොට අවුරුදු අටක් වයස ඇති, පාසල් ශිෂ්‍ය වාස්යා ඉවානොව්ට මිනිත්තුවකදී කිසිවක්ම කරන්න බැහැ. එයා කියන්නේ මිනිත්තුව හුඟාක් පුංචියි කියලයි.

දැන් අපි බලමු.

ඔබ තත්පර දහයකදී ප්‍රයෝජනවත් දෙයක් නොකළා නම් ඔලිම්පික් පදක්කම අහිමි වන කෙනා ඔබයි.

ඔබ මිනිත්තුවක් නාස්ති කළොත්, ඒක හරියටම ඔබ කිලෝ ග්‍රෑම් පහක මැකරෝනි හදන්න අසමත් වුණා වගෙයි.

එතකොට ඔබ පැයක් ඔහේ ගෙවෙන්න ඇරියා නම් ඔබට සිතා ගත හැකියි ඔබ මුළු කඩයකටම ඕනෑ කරන මැකරෝනි හැදීමට අසමත් වීමට වග කියන්න ඕනෑ කියලා.

තත්පරයක, මිනිත්තුවක, පැයක තේරුම ඒකයි.

ඔබේ එලාම් ඔරලෝසුව නැති වුණා නම් ඔබට අලුත් එකක් මිළදී ගත හැකියි. ඒත් ඔබට කාලය නැති වුණා නම්, ඒක ආපහු අදින්න නම් බෑ!

ඒ නිසයි ළමයිනුත්, වැඩුණු අයත් හැමෝම මේක දැන ගන්න ඕනෑ,

කාලය රන් හා සමානයි!

සිතුවම්
විලැඩිමීර් කුල්කොව්

පරිගණක පිටු සැකසුම්
ගයානී නිලංකා ගලගෙදර

සයුරි ප්‍රකාශන
අංක 102/176
මත්තෙගොඩ නිවාස සංකීර්ණය පාර
මත්තෙගොඩ
දුරකතන : 0115-676483 0715 181421 ෆැක්ස් 0112 844961

ISBN 978-955-1889-4-3

90/-